දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ
மாவட்ட செயலகம் - மாத்தளை
DISTRICT SECRETARIAT – MATALE

කාර්යාලය / அலுவலகம் / Office 066 2222233
දිසාපති / දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / GA/District Secretary 066 2222235, 066 2222236
නිල නිවස / வீடு / Residency 066 2222205
වෙබ් අඩවිය / ,iz a jsk; / Web Site www.matale.dist.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail moha.dist.matale@gmail.com
ෆැක්ස් / பெக்ஸ் / Fax 066 2226542

මගේ අංකය / எனது இல / My No DSM/ACC/5/3/1/2024
ඔබේ අංකය / உமது இல
දිනය / திகதி / Date 2024.12 02

ප්‍රාදේශීය ලේකම්,
මාතලේ / රත්තොට / යටවත්ත / උකුවෙල / නාඋල / දඹුල්ල
පල්ලේපොල / ගලේවෙල / අඹන්ගඟකෝරළේ / විල්ගමුව / ලග්ගල
පරිපාලන නිලධාරී - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 2024 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම පිණිස නිලධාරින්ගේ තොරතුරු ලබා ගැනීම

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 හි සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධ වෙනත් දෙපාර්තමේන්තු යටතේ පවතින කාර්යාලවල, 2024 වර්ෂය සඳහා වන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා භාණ්ඩ සමීක්ෂණයට අදාල ඉදිරි කටයුතු සඳහා සමීක්ෂණ මණ්ඩල පත් කිරීමට කළමනාකරණ සේවා නිලධාරීන් / සංවර්ධන නිලධාරීන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට අවශ්‍යව ඇත.

02. ඒ අනුව, භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා කැමැත්තක් දක්වන හා මනා පරිචයකින් යුත්, සහ වගකීමෙන් කටයුතු කිරීමට උනන්දුවක් දක්වන ඔබ කාර්යාලයට අනුයුක්ත සේවය කරනු ලබන උක්ත නිලධාරින්ගේ තොරතුරු පහත සඳහන් සබැඳිය (Link) මගින් ලබා දී ඇති Google Form සම්පූර්ණ කර 2024 දෙසැම්බර් 10 දිනට පෙර එවිය යුතු අතර ඒ සඳහා ඔබ කාර්යාලයේ අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙස දන්වා සිටිමි. ඔවුන්ගේ පහසුව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතලේ නිල වෙබ් අඩවියේද ඉහත Link එක දක්වා ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි.

03. ඉදිරියේදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීමේදී මෙම තොරතුරු පදනම් කර ගන්නා බවත්, පත් කිරීමට අවශ්‍යය සමීක්ෂණ මණ්ඩල ප්‍රමාණය අනුව, නිලධාරීන් එම ලැයිස්තු වලින් තෝරා පත් කිරීමට ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරණු ලබන බවත් දන්වමි. තවද, ප්‍රමාණවත් නිලධාරීන් නොමැති විටදී හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු වඩාත් කාර්යක්ෂමව ඉටුකරවා ගැනීමට අවශ්‍ය වන අවස්ථාවලදී එකම නිලධාරීන්, මණ්ඩල කිහිපයකට පත්කිරීමට හෝ මෙම ලැයිස්තුවෙන් පරිබාහිරව ඔබ ආයතනයේ සේවය කරණු ලබන වෙනත් ඕනෑම නිලධාරියකු සමීක්ෂණ මණ්ඩල සඳහා පත් කිරීමට හෝ කටයුතු කරණු ලබන බවද වැඩිදුරටත් දන්වමි.

04. රාජ්‍ය වත්කම් ආරක්ෂාව සහ යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමු කොට, ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කරණ ලෙස දන්වා සිටිමි.

Link- https://forms.gle/xbyUjqJhJyWXCP9e8

තේජානි තිලකරත්න
මාතලේ දිස්ත්‍රික් ලේකම් / දිසාපති

තේජානි තිලකරත්න
දිස්ත්‍රික් ලේකම් / දිසා:
මාතලේ.